# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,138 - 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 178 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 180 |


*සැ. යු.* -(i) උකස් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

177 - B 081553 - 353 (2019/08)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ ආණ්ඩුකාරවරයා විසින් 1959.03.20 දින ප්‍රදනය කර ඇති අංක ආර්. 5753 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මොරගොල්ලාහේන ජනපදයේ පදිංචි ලියන පේඩිගේ සිරිසේන වෙත ප්‍රදාන කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 268 යටතේ 1959.06.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.09.06 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිණිගොඩ කෝරළයේ කන්සලගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අඹතැන්න නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කෑගල්ල මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අවසාන ගම් සිතියම් අක 103 හි කැබලි අංක 35 දරන අක්. 0, රූඩ් 03, පර්. 38 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම මොරගොල්ලාහේන.

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 34 , |
| *නැගෙනහිරට* | : කට්ටි අංක ඩී, |
| *දකුණට* | : කට්ටි අංක 36, |
| *බටහිරට* | : මාර්ග රක්ෂිතය. |

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2019 මැයි මස 17 වැනි දින.

08-847/4

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) එම්. එම්. පී. ප්‍රියංගනී පෙතන්ගොඩ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1960.05.29 දින ප්‍රදනය කර ඇති අංක R 6167 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොරවක්ක ජනපදයේ පදිංචි වැද්දාගල මුදියන්සේලාගේ උක්කුබණ්ඩා වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 139 යටතේ 1960.09.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.09.06 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිණිගොඩ කෝරළයේ ලෙව්කේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොරවක්ක නමැති ගමෙහි කොරවක්කහේන ජනපදයෙහි පිහිටා ඇත්තාවූ ද, ...................... භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක ............ දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ ............... විසින් සම්පාදිත අංක PPA 382 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ .................. විසින් සම්පාදිත අංක ................. දරන රේඛා සටහනේ අංක 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් අක්. 0, රූඩ් 03, පර්. 27 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම්වූ ද රජයේ ඉඩමඃ කොරවක්කහේන.

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. ඒ. 382 හි කැබලි අංක 40 හා එපිටවත්තහේන , |
| *නැගෙනහිරට* | : පි. පි. ඒ. 382 හි කැබලි අංක 44 ජනපද පාර, |
| *දකුණට* | : පි. පි. ඒ. 382 හි කැබලි අංක 41, 37, |
| *බටහිරට* | : පි. පි. ඒ. 382 හි කැබලි අංක 38. |

එම්. එම්. පී. ප්‍රියංගනී පෙතන්ගොඩ,
ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, (අන්තර් පළාත්),
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මාවනැල්ල.

2019 අප්‍රේල් මස 03 වැනි දින.

08-847/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂගේ තිළිණ ප්‍රදීප් සුමනසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1994.04.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/අකෝ/366 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නිශ්ශංක උයන පදිංචි කොස්වත්තේ ගුණසේන මහතා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී 05/125 යටතේ 1994.06.16 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.09.06 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

නුවරඑළිය, පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව පත්තුවේ/කෝරළේ ගවරවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගවරවිල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක - දරන කේෂත්‍ර පත්‍රයෙහි අංක පි. පී. නු. 1337 දරන අංක 21 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.059 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම: ගවරවිල වත්ත බ්‍රාගෝ ඩිවිෂන්.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 08 හා 20, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 23 වැනි ඉඩම, |
| *දකුණට* | : | කැබලි අංක 22 සහ 23, |
| *බටහිරට* | : | ජනපද පාර අංක 22, 19 සහ 20. |

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2019 ජූනි මස 26 වැනි දින.

08-847/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මගේ අංකය : පුත්/කල්/ප්‍ර/31132/579.

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මොහොට්ටි මුදියන්සේලාගේ නන්දන සෝමතිලක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තිය (4) වන උප වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති විසින් වර්ෂ 1996 පෙබරවාරි මස 29 වැනි දින නිර්මලපුර පදිංචි කඩුපිටියමුනිගේ ඇල්බට් සිල්වා යන අය වෙත ප්‍රදනය කර ඇති අංක පුත්/කල්/ප්‍ර/31132 දරන ප්‍රදාන පත්‍ර සහිත පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී ප්‍රදානපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.09.06 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාම්පුරිය පත්තුවේ/කෝරළයේ, නිර්මලපුර (605B) ග්‍රාම නිලධාරි වසමේ. නිර්මලපුර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ් 00, පර්චස් 00ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පේදුරු පුල්ලගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | මංජුගේ ඉඩම, |
| *දකුණට* | : | රුවන්ගේ ඉඩම, |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

එම්. එම්. එන්. සෝමතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2019 මැයි මස 17 වැනි දින.

08-847/1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :-4/10/55663.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L4/M/04.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 67 බටහිර මැදවච්චිය ග්‍රාම නිලධාරි වසමේ මැදවච්චිය ගමේ අ. ග. පි. 112 කැබලි අංක 01 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.1846 අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ කටයුතු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ග රක්ෂිතය - අ. ග. පි. 112 හි කැබලි අංක 239, |
| *නැගෙනහිරට* | : | මන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ග රක්ෂිතය - අ. ග. පි. 112 හි කැබලි අංක 16, |
| *දකුණට* | : | රජයේ ඉඩම් - අ. ග. පි. 112 හි කැබලි අංක 239, |
| *බටහිරට* | : | වෙන් කළ පාර රක්ෂිතය - අ. ග. පි. 112 හි කැබලි අංක 239. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* : අවුරුදු තිහයි (30) (2018.05.18 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* : 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2018 වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තස්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත්විය යුතුය.

*(ඉ)* සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

*(උ)* 2018.05.18 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06ක් ඇතුළත දී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 අගෝස්තු මස 23 වැනි දින,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-953

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/26267
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : ඉ/7/දීබ/තම/නසී/167.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 172, පොළොන්නරුව ග්‍රාම නිලධාරි වසමේ පොළොන්නරුව ගමේ අංක 2008/03/තම/06 අනුරේඛනයේ

කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01, පර්. 12.5 ක ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා හෙට්ටි ආරච්චිගේ ආනන්ද මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඒ. ඒ. පතිරාජ හා පාර රක්ෂිතය, පාර |
| *නැගෙනහිරට* | : | අනුර ශාන්ත හා කරලයින් නානායක්කාර, |
| *දකුණට* | : | පාර රක්ෂිතය හා කරලයින් නානායක්කාර |
| *බටහිරට* | : | පාර හා පාර රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* : අවුරුදු තිහයි (30) (1995.06.15 සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50%ට නොවැඩි විය යුතු ය.

*දඩ මුදල* : ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත්විය යුතුය.

*(ඉ)* සාද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

*(උ)* අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06ක් ඇතුළත දී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 අගෝස්තු මස 23 වැනි දින,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-848

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.